**රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව - 2021**

**------------------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

---------------

1.1 මතය

------

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාව අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාව වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළදී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත සපයා තිබුණු ඖෂධ වෙනුවෙන් ලැබිය යුතු රු.4,162,500 ක් 2022 මැයි 27 දින වන විටත් අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. | රාජ්‍ය ඖෂධ සංස්ථාව සමඟ ඇතිව තිබුණු කාර්යසාධන බැඳුම්කර (Performance Bond) ප්‍රශ්නය නිරවුල් කර ගැනීමට යම් කාලයක් ගතවීම හේතුවෙන් මේ වන විට ඉන්වොයිස් 02 කට අදාළ රු.4,162,500 ක් පමණක් අයවීමට ඇති බව. | හිඟ මුදල් අය කර ගැනීම සඳහා නිරන්තර පසු විපරමකින් කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 දෙසැම්බර් 31 දිනට රු.556,216,467 ක් වූ වෙළඳ ණයහිමි ශේෂයෙන් රු.11,223,744 ක් වර්ෂ 01 සිට වර්ෂ 04 දක්වා කාලසීමාවක් ඉක්මවා තිබුණු නමුත් 2022 මාර්තු 25 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය ලියකියවිලි නොලැබීම, ලැබී ඇති ලියකියවිලි සම්පූර්ණ නොවීම, අදාළ සනාථ කිරීම් සම්පූර්ණ නොවීම හා සමහර කාර්යයන් තවමත් සම්පූර්ණ නොවීම මත ගෙවීම් සිදු කිරීමට අපහසුවී තිබෙන බව. | ණයහිමියන් නියමිත කාලසීමාව තුළ විධිමත් ලෙස පියවීමට කටයුතු කළ යුතුය. |

1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ 06(2)(අ) වගන්තිය. | සේවකයා සම්පූර්ණ වශයෙන් සේවය කරන ලද එක් එක් වර්ෂය සඳහා මාස භාගයක වැටුප හෝ වේතනය මත පදනම්ව සේවක පාරිතෝෂික වෙන් කිරීම් සිදු කළ යුතු වුවද, ඒ වෙනුවට සේවකයාගේ සම්පූර්ණ මාසයක වැටුප පදනම් කර ගෙන සේවක පාරිතෝෂික වෙන් කිරීම් සිදු කර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකු වෙත පාරිතෝෂික දීමනා ලෙස රු.මිලියන 1.33 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | මේ සම්බන්ධයෙන් කම්කරු පනතේ ඇති ප්‍රතිපාදන සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්තුමාගේ උපදෙස් ලිඛිතව ලබාගෙන ඇති බව, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති මෙහෙයුම් අත්පොතේ 2.3 පරිච්ඡේදය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලයට මූල්‍ය අත්පොත අනුමත කිරීමේ බලය පවරා ඇති බව හා මෙම ගෙවීම් ඇතුළත් මූල්‍ය අත්පොත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති බව. | පනතේ අදාළ වගන්තිවල දැක්වෙන විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයෙහි මුදල් රෙගුලාසි 570 හා 571(2). | තැන්පත් කළ දින සිට වර්ෂ 02 ඉක්මවා තිබුණු එකතුව රු.1,870,504 ක ඉකුත් තැන්පතු නිරවුල් කිරීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ පාර්ශවයන් දැනුවත් කර තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ඇ)** 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 103, 104 හා 105. | සමාලෝචිත වර්ෂය තුළදී මුළු පිරිවැය රු.3,837,426 ක් වූ ඖෂධ අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 1,841 ක් හා ඇසුරුම් ද්‍රව්‍ය තොග ඒකක 865,376 ක් විවිධ හේතූන් මත ප්‍රතික්ෂේප කර තිබුණු නමුත් මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පවත්වා වගකිව යුත්තන් නිශ්චය කිරීමට හා අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඊට අමතරව 2021 දෙසැම්බර් 31 දින වන විට භාවිතයට ගත නොහැකි පිරිවැය රු.1,705,675 ක් වූ අමුද්‍රව්‍ය තොග, පිරිවැය රු.1,886,980 ක් වූ නොනිම් ද්‍රව්‍ය තොග, පිරිවැය රු.152,142 ක් වූ නිමිද්‍රව්‍ය තොග විධිමත් ලෙස අපහරණය කිරීමටද, එම තොග සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව | පිරිවැය රු.1,693,902 ක නොනිම් ද්‍රව්‍ය තොග විනාශ කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇති බව, එම අයිතම විනාශ කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතින බව හා ඇසුරුම් ද්‍රව්‍ය තොග අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත අපහරණය කර ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | පරීක්ෂණ පවත්වා වගකිව යුත්තන් නිශ්වය කිරීමට සහ ඉකුත් වර්ෂවල භාණ්ඩ සමීක්ෂණවලදී හඳුනාගෙන තිබුණු පිරිවැය රු.3,855,964 ක් වූ ප්‍රතික්ෂේපිත හා හානි වූ අමුද්‍රව්‍ය තොග පොත්වලින් කපාහැරීම හේතුවෙන් සංස්ථාවට දැරීමට සිදු වූ අලාභය පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පවත්වා වගකිව යුත්තන් නිශ්වය කිරීමට හා අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | | |
| (ඈ) | 1997 පෙබරවාරි 03 දිනැති අංක 6/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 වන ඡේදය. | වැඩ බැලීමේ කාලය මාස 03 ක උපරිමයකට යටත් විය යුතු වුවද, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි වට්ටෝරු හා පර්යේෂණ තනතුර සඳහා අඛණ්ඩව වර්ෂ 04 කට අධික කාලයක් වැඩ බැලීමේ පදනම මත නිලධාරියෙකු බඳවා ගෙන තිබුණි. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වට්ටෝරු හා පර්යේෂණ තනතුරේ සේවය කරන ලද නිලධාරිනිය සේවයෙන් අස්වීම නිසා එම අංශයේම කළමනාකරු ලෙස සේවය කරන ලද නිලධාරී මහතා වැඩ බැලීම සඳහා පත් කළ බව, ඒ අතරතුර කිහිප අවස්ථාවකදීම එම තනතුර සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවූවත් සුදුසුකම් සැපිරූ කිසිදු අයදුම්කරුවෙක් අයදුම්කර නොතිබුණු බව, 2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 අනුව බඳවා ගැනීම් තාවකාලිකව නවතා ඇති අතර බඳවා ගැනීම් සඳහා අනුමැතිය ලද වහාම බඳවා ගැනීම් සිදු කරන බව. | -එම- |
| (ඉ) | 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | එක් නිලධාරියෙකුට ගෙවිය හැකි උපරිම ආපදා ණය මුදල රු.250,000 කට සීමා කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 107 දෙනෙකු වෙත එම සීමාව ඉක්මවා රු.13,656,100 ක් ගෙවා තිබුණි. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති මෙහෙයුම් අත්පොතේ 2.3 පරිච්ඡේදය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලයට මූල්‍ය අත්පොත අනුමත කිරීමේ බලය පවරා ඇති බව හා මෙම ගෙවීම් ඇතුළත් මූල්‍ය අත්පොත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති බව. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන | ආයතනයේ ව්‍යාපාරික මෙහෙයුම්, මූල්‍ය හා මූල්‍ය නොවන අවදානම්වල බලපෑම ගණනය කිරීම හා ආයතනයේ ක්‍රියාකාරිත්වයට බලපාන අවදානම් අවම | 2022 වර්ෂය සඳහා එම කමිටුව පත් කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ යෙහි 4.3 ඡේදය. | කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා සංස්ථාව විසින් අවදානම් කළමනාකරණ කමිටුවක් පත්කළ යුතු වුවද, 2022 මැයි 30 දින වන විටත් එම කමිටුව පත්කර නොතිබුණි. | | |
| (උ) | 2021 දෙසැම්බර් 15 දිනැති අංක පීඊඩී 03/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | වාර්ෂිකව රු.13,500 ක ප්‍රසාද දීමනාවක් පමණක් ගෙවිය හැකි වුවද, ඊට අමතරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් එක් සේවකයෙකුගේ මසක වැටුප වශයෙන් වන ලෙස රු.14,720,810ක විශේෂ ප්‍රසාද දීමනාවක්ද, එක් සේවකයෙකුට රු.5,000 ක් හෝ රු.10,000 ක් බැගින් වන ලෙස රු.3,017,229 ක සභාපති ප්‍රසාද දීමනාවක්ද ගෙවා තිබුණි. ඒ අනුව ඉහත චක්‍රලේඛයෙන් අනුමත සීමාව ඉක්මවා හා විධිමත් අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රසාද දීමනා ලෙස රු.17,738,039 ක් වැඩිපුර ගෙවා තිබුණි. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති මෙහෙයුම් අත්පොතේ 2.3 පරිච්ඡේදය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලයට මූල්‍ය අත්පොත අනුමත කිරීමේ බලය පවරා ඇති බව හා මෙම ගෙවීම් ඇතුළත් මූල්‍ය අත්පොත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති බව. | -එම- |
| (ඌ) | 2009 මාර්තු 09 දිනැති අංක ඩීඑම්එස්/ඊ4/10/4/090/2 දරන සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් ඇමතු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය. | | | |
| | (i) 02-01ඡේදය. | විධායක හා විධායක නොවන නිලධාරීන් වෙත දුර ප්‍රමාණය සලකා ප්‍රවාහන දීමනා ගෙවිය යුතු වුවද, දුර ප්‍රමාණය නොසලකා 2009 වර්ෂයේ සිට මාසිකව පිළිවෙලින් රු.4,700 ක හා රු.3,000 ක ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි. 2019 වර්ෂයේ සිට අධ්‍යක්ෂක මණ්ඩල තීරණයකට අනුව එම මාසික දීමනාව පිළිවෙලින් රු.11,500 ක් හා රු.6,000 ක් දක්වා වැඩිකර ගෙවා තිබුණි. | -එම- | අධ්‍යක්ෂක මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීමට පෙර අදාළ අවස්ථාවලදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. මේ වන විට ගෙවා ඇති දීමනා සම්බන්ධයෙන් |

| | | | |
|---|---|---|---|
| | | | ආවරණ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) 02-02ඡේදය. | කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙත මාසික නිෂ්පාදන දිරි දීමනාවක් ලෙස රු.4,000 ක් පමණක් ගෙවිය හැකි වුවද, ඊට අනුකූල නොවන ලෙස 2011 ජූලි 01 දින සිට මාසිකව උපරිමය රු.12,000 කට යටත්ව සමස්ත කාර්ය මණ්ඩලය වෙත නිෂ්පාදන දිරි දීමනා ගෙවා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළදී වැඩියෙන් ගෙවා තිබුණු රු.16,256,313 ක් ද ඇතුළුව 2011 ජූලි 01 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළදී නිෂ්පාදන දිරි දීමනා ලෙස මුළු එකතුව රු.137,490,554 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | -එම- | -එම- |
| (iii) 02-03ඡේදය. | (i) පැමිණීමේ දිරි දීමනා ලෙස මසකට එක් සේවකයෙකුට රු.2,000 ක් පමණක් ගෙවීමට අනුමැතිය ලැබී තිබුණද එය රු.3,500 ක් දක්වා වැඩි කර ගෙවා තිබුණි. | -එම- | -එම- |
| | (ii) පැමිණීමේ දිරිදීමනා ගෙවන්නේ නම් වර්ෂය අවසානයේ ඉතිරි නිවාඩු සඳහා මුදල් ගෙවිය නොහැකිවුවද, පැමිණීමේ දිරි දීමනාව ගෙවා තිබුණු සේවකයින් සඳහා සමාලෝචිත වර්ෂය අවසානයේ ඉතිරි නිවාඩු වෙනුවෙන් රු.14,359,173 ක් ගෙවා තිබුණි. | -එම- | -එම- |
| (iv)02-04 ඡේදය. | අවුරුදු හා නත්තල් වෙනුවෙන් වර්ෂයකට එක් අයෙකුට එක් වතාවක් පමණක් රු.6,000 ක තෑගි වවුචර් ලබාදිය හැකි වුවද, සමාලෝචිත වර්ෂය තුළදී ස්ථිර සේවකයන්ට රු.25,000 ක් බැගින් හා පුහුණු සේවකයන්ට රු.12,500 ක් බැගින් වූ මුළු පිරිවැය රු.7,179,875 ක් වූ තෑගි වවුචර්ද, ඊට අමතරව පාසල් පොත් හා උපකරණ මිලදී ගැනීමට ස්ථිර සේවකයෙකුට රු.12,500 ක් බැගින් හා අනෙකුත් සේවකයන්ට රු.6,250 ක් බැගින් මුළු පිරිවැය රු.5,037,500 ක් වූ තෑගි වවුචර්ද ලබාදී තිබුණි. | -එම- | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | (v) 02-06 ඡේදය. | යම් සේවකයෙකුට නියමිත සේවාමුර සියල්ලටම පැමිණියහොත් පමණක් රු.1,000 ක මාසික දීමනාවක් ගෙවිය හැකි වුවද, සහභාගී වූ එක් එක් සේවාමුරයක් වෙනුවෙන් විධායක, පුහුණු වන විධායක හා විධායක නොවන සේවකයන්ට පිළිවෙලින් රු.400 ක්, රු.300 ක් හා රු.200 ක් බැගින් වන පරිදි සමාලෝචිත වර්ෂය තුළදී රු.4,891,000 ක් සේවාමුර දීමනාව වශයෙන් ගෙවා තිබුණු අතර වැඩිපුර ගෙවා තිබුණු සේවාමුර දීමනා රු.2,575,000 ක් විය. | -එම- | -එම- |
| (එ) | 2015 ජුනි 04 දිනැති අංක BP/30/15 දරන අධ්‍යක්ෂක මණ්ඩල තීරණය. | සංස්ථාවේ සේවකයන් සඳහා ගෙවනු ලබන පා පැදි ණය 2015 ජුනි 04 දින සිට රු.3,000 සිට රු.20,000 ක් දක්වා වැඩිකර තිබුණු නමුත් ඒ සඳහා ලබා ගත යුතු භාණ්ඩාගාර අනුමැතිය විගණන දින වන විටත් ලබාගෙන නොතිබුණි. | -එම- | අධ්‍යක්ෂක මණ්ඩල තීරණය ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතුය. |

1.7 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම
--------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාව විසින් 2021/2020 තක්සේරු වර්ෂයට අදාළව 2021දෙසැම්බර් 30 දින දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත මාර්ගගත ක්‍රමයට ඉදිරිපත් කර තිබුණු බදු වාර්තාවට අනුව ස්වතක්සේරු බදු ලෙස රු.166,941,903 ක් ගෙවූ බව සඳහන් කර තිබුණු නමුත් සංස්ථාව තුළ වූ බදු ආගණන වාර්තා හා ගෙවීම් වවුචර් අනුව තත්‍ය ස්වතක්සේරු බදු ගෙවීම රු.166,351,979 ක් පමණක් වූයෙන් වෙනස රු.589,924 ක් විය. වෙනසට හේතු අනාවරණය නොකෙරුණි. | දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තු පරිගණක පද්ධතියේ ඇති දෝෂයක් හේතුවෙන් මෙය සිදු වී ඇති බව, බදු ගණනය කිරීම හෝ ගිණුම්ගත කිරීමේ වරදක් නොමැති බව හා මේ සම්බන්ධයෙන් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර නිවැරදි වාර්තාවක් ලබාගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ බදු වාර්තාව හා සංස්ථාවේ බදු ආගණන වාර්තා අනුව ඇති වෙනස්කම් සැසඳිය යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය
---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,006,185,465 ක ලාභයක්වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.1,017,364,317 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.11,178,852 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට විකුණුම් හා බෙදාහැරීමේ වියදම් සියයට 122 කින් හා බදු වියදම සියයට 59 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

2.2 ප්‍රධාන වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් පිළිවෙලින් රු.49,137,643 ක් හා රු.109,186,789 ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එම වියදම සියයට 122 කින් ඉහල ගොස් තිබුණි. එහි ඇතුළත් විකුණුම් ප්‍රවර්ධන වට්ටම් සහ වියදම් සියයට 101 කින් වැඩිවීම ඊට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සහ ශුද්ධ ලාභ අනුපාතය පිළිවෙළින් සියයට 1.1 කින් සහ සියයට 0.7 කින් අඩුවී තිබුණු අතර ණයගැති පිරිවැටුම් අනුපාතයේ වාර 21.4 ක වැඩිවීමක්ද, ණය අයකර ගැනීමේ කාලයේ දින 42 ක අඩුවීමක්ද විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොදු පරීක්ෂණ රසායනාගාරයක් සහ පුහුණු පාසලක් පිහිටුවීමේ අරමුණින් මුළු මුදල රු.133,767,599 ක් වැයකර මිලදී ගෙන නවීකරණය කර තිබුණු ගොඩනැගිල්ලක් 2019 අගෝස්තු 20 දින සිට 2022 මැයි 27 දින වන විටත් නිෂ්කාර්යව වසා දමා තිබුණු අතර රසායනාගාරය සහ පුහුණු පාසලක් පිහිටුවීම සඳහා සපුරාලිය යුතු අනෙකුත් අවශ්‍යතා කිසිවක් සම්පූර්ණ කිරීම සඳහා සංස්ථාවේ පෙර සැලස්මක් හෝ සූදානමක් නොතිබීම හේතුවෙන් මෙම තත්ත්වය ඇතිවී තිබුණි. මේ බව අවස්ථා කිහිපයකදීම විගණන වාර්තාවලින් පෙන්වාදී තිබුණු නමුත් සංස්ථා බලධාරීන් විසින් ඒ සඳහා නිසි පියවර ගෙන නොතිබුණි. | රසායනාගාරය හා පුහුණු පාසල පිහිටුවීමට නියමිතව තිබුණු හොරණ බුලත්සිංහල ගොඩනැගිල්ල විකිණීම හෝ බදුදීම සඳහා මිල ගණන් කැඳවීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇති බව හා 2022 පෙබරවාරි 13 දින ඒ සඳහා පුවත්පත් මගින් දැන්වීම් පළ කර ඇති බව. | ගොඩනැගිල්ල උපයෝජනය සඳහා නිශ්චිත සැලසුමකට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ජංගම නොවන වත්කම් සඳහා අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.667,436,317ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. | 2021 වර්ෂයේ සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගන්නා ස්ථාවර වත්කම් සඳහා ප්‍රත්‍යාගණන කටයුතු අවසන් කර කෙටුම්පත් වාර්තාව මේ වන විට ලැබී ඇති බව හා අවසන් ප්‍රත්‍යාගණන වාර්තාව ලැබීමෙන් පසුව 2022 වසර තුළදී ගිණුම්වල අවශ්‍ය ප්‍රතිපාදනයන් සිදුකරන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2021 දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම්වල ඇතුළත් පිරිවැය රු.8,302,287 ක් වූ අයිතම 101 ක් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සිදු කර තිබුණු භෞතික සමීක්ෂණයට ලක්වී නොතිබුණු අතර එම අයිතම ඌනතා ලෙසද හඳුනාගෙන නොතිබුණි. | භෞතිකව සමීක්ෂණයට ලක්වී නොතිබීමට හේතු කවරේද යන්න ස්ථාවර වත්කම් කමිටුවක් මගින් නිරීක්ෂණය කරමින් පවතින බව හා අදාළ තොරතුරු ඉදිරියේදී විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | සංස්ථාවේ සියලුම ජංගම නොවන වත්කම් භෞතික සමීක්ෂණයට ලක්විය යුතු අතර ඌනතා හා අතිරික්තතා හඳුනාගෙන වාර්තා කළ යුතුය. |

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අලෙවි සැලැස්මට හා මාසික නිෂ්පාදන සැලැස්මට අනුව හඳුනාගෙන තිබුණු මුළු නිෂ්පාදන අවශ්‍යතාවය අතර ඖෂධ වර්ග 81 ක ඒකක මිලියන 120 ක වෙනසක් පැවතුණි. | පවත්නා තොග මට්ටම් සැලකිල්ලට ගනිමින් හා වෙළඳපල ඉල්ලුම් පදනම් කරගනිමින් අලෙවි අංශයේ නිෂ්පාදන අවශ්‍යතාවය පිළියෙල කරන බව, කාලපරිච්ඡේදය තුළදී ගබඩාවල පවතින අමුද්‍රව්‍ය වර්ග හා ඒවායේ ප්‍රමාණයන්, පවත්නා යන්ත්‍ර හා ඒවායෙහි ධාරිතාවයන් හා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අනුමැතිය ලැබී ඇති නිෂ්පාදන වට්ටෝරු යනාදී කරුණු සැලකිල්ලට ගනිමින් මාසික නිෂ්පාදන සැලැස්ම පිළියෙල කරන බව හා එවැනි අවස්ථාවලදී මෙවැනි වෙනස්කම් සිදුවිය හැකි බව. | වාර්ෂික අලෙවි සැලැස්මේ ඉලක්ක කරා ළඟාවීමට උපරිම උත්සහාය දැරිය යුතු අතරම මාසික නිෂ්පාදන සැලසුම් වලටද අනුගත විය යුතුය. |
| (ආ) | අලෙවි සැලැස්මට අනුව හඳුනාගෙන තිබුණු මුළු නිෂ්පාදන අවශ්‍යතාවය ඖෂධ වර්ග 58 ක ඒකක මිලියන 1,877 ක් වූ නමුත් සත්‍ය නිෂ්පාදනය ඖෂධ වර්ග 25 ක ඒකක මිලියන 1,127 ක් පමණක් විය. | -එම- | උපරිම නිෂ්පාදන කාර්යක්ෂමතාවයෙන් සහ ඵලදායීතාවයෙන් නිෂ්පාදනය කිරීම සඳහා තාත්වික නිෂ්පාදන සහ අලෙවි සැලසුම් පිළියෙල කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී නිෂ්පාදනය කර තිබුණු ඖෂධ වර්ගවල පෙති කුඩා කොටස්වලට කැඩී යාමේ හැකියාව ඉහළ යාම, ඖෂධ පෙතිවල බරෙහි ඇති වූ විචලතා, අයහපත් පෙනුම හා ඖෂධ පෙති කැඩීමට ඇති වූ අපහසුතා වැනි හේතූන් මත නිෂ්පාදනය අතරමඟ නවතා නැවත නිෂ්පාදනය කිරීමට සිදුවීම හේතුවෙන් වැයවී තිබුණු | ආයතනයක ප්‍රතිනිෂ්පාදනය කිරීමට සිදුවීම අවම කිරීම සඳහා quality assurance ක්‍රමවේදය වැදගත් වන බව, මෙහිදී එකම ප්‍රමිතියකින් යුතු අමුද්‍රව්‍ය, එකම ක්‍රමවේදයක නිෂ්පාදනය මඟින් අවසන් නිපැයුම නියමිත තත්ත්වයෙන් යුතු බව තහවුරු කරන බව, නමුත් ටෙන්ඩර් ක්‍රමවේදය නිසා මිලදී ගන්නා | ඖෂධවල ගුණාත්මක තත්ත්වය ඉහළ නංවා ගැනීමට හා නිෂ්පාදන ගැටළු අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අතිරේක පිරිවැය රු.2,749,960 ක් විය. සෑම වර්ෂයකදීම නිෂ්පාදන ක්‍රියාවලියේ සිදුවන මෙම අයහපත් තත්ත්වයන් අවම කරගැනීමට කටයුතු කර නොතිබුණි. | අමුද්‍රව්‍ය මිල සමහර ගුණයකින් නිතර විචලනය වන බව, එබැවින් නිසි ලෙස quality assurance ක්‍රමවේදය පවත්වා ගත නොහැකි බව හා එවැනි පරිසරයක් තුළ ප්‍රති නිෂ්පාදන කිරීම් ඇතිවිය හැකි බව. | |
| (ඇ) | ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් නිශ්චය කර තිබුණු උපරිම විකුණුම් මිල ඉක්මවූ මිලකට සංස්ථාව විසින් නිෂ්පාදනය කර තිබුණු ඖෂධ වර්ග 07 ක් නිෂ්පාදන පිරිවැයට වඩා අඩුවෙන් මිල නියම කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී ඉන් ඖෂධ අයිතම 03 ක් ඒවායේ නිෂ්පාදන පිරිවැයට වඩා අඩුවෙන් අලෙවි කිරීම තුළින් රු.38,593,701 ක අලාභයක් දැරීමට සිදුවී තිබුණි. | මෙහි සඳහන් නිෂ්පාදන අයිතම අතුරෙන් Cloxacillin capsule BP 500mg (Blister) හා Diltiazem Tablets 60mg (Blister) යන නිෂ්පාදන අයිතමයන් දෙකම විවෘත වෙළඳපල අලෙවිය සඳහා ඉල්ලුම් ලැබුණු නමුත් එම නිෂ්පාදනයන් Blister ඇසුරුම් ලෙස ලබාදීමට ඇති පහසුකම් නොමැතිවීම හේතුවෙන් විවෘත වෙළඳපල තුළ අලෙවි කළ නොහැකිවූ බව හා ඉදිරියේදී එම නිෂ්පාදනයන් විවෘත වෙළඳපලට හඳුන්වා දෙන අවස්ථාවකදී පිරිවැය හා වෙළඳපල මිල ගණන් පදනම් කර ගෙන මිල තීරණය කරන බව. | සංස්ථාවට අලාභයක් නොවන ලෙස කටයුතු කළ යුතු අතර අවම වශයෙන් නිෂ්පාදන පිරිවැය ආවරණය වන ලෙස මිල තීරණය කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළදී වෛද්‍ය සැපයීම් අංශයට විකිණීම සඳහා සැලසුම්කර තිබුණු විකුණුම් වටිනාකම රු.2,714,300,224 ක් වූ ඖෂධ වර්ග 72 කින් ඒකක මිලියන 1202, ක සැපයුම් ඉලක්කයක් සපුරා ගත නොහැකිවී තිබුණි. ඉන් විකුණුම් වටිනාකම රු.558,481,531 ක් වූ ඒකක මිලියන 375.7 ක සැපයුම් ඉලක්කයක් අපේක්ෂා කර තිබුණු ඖෂධ අයිතම 18 ක මුළු සැපයුම හා විකුණුම් වටිනාකම රු.666,007,940 ක් වූ ඒකක මිලියන 465.4ක සැපයුම් ඉලක්කයක් අපේක්ෂා කර තිබුණු ඖෂධ අයිතම 6 කින් සියයට 50ක සැපයුම් ප්‍රමාණයක් සපුරාලීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි. | අලෙවි සැලැස්ම ආයතනයේ ඉදිරි වර්ෂයේ සැලසුම් කටයුතු සඳහා මඟ පෙන්වීමක් කරන අතර එය දළ ඇස්තමේන්තුවක් පමණක් බව, අලෙවි සැලැස්මක් ඒ ආකාරයෙන්ම ලබා කර ගත නොහැකි වන අවස්ථා පවතින බව හා යම්කිසි ප්‍රතිශතයකින් මෙම අගයන් ඉහළ හෝ පහළ යා හැකි බව. | තාත්වික වාර්ෂික අලෙවි සැලැස්මක් පිළියෙල කළ යුතු අතර අවශ්‍ය අවස්ථාවන්වලදී එය විධිමත් අනුමැතියකින් සංශෝධනය කළ යුතු අතර ඉලක්ක කරා ළඟාවීමට උපරිම උත්සාහය දැරිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | අමුද්‍රව්‍ය නොමැතිවීම, යන්ත්‍ර ධාරිතාවය ප්‍රමාණවත් නොවීම, නිෂ්පාදන ක්‍රියාවලියේ පවත්නා තාක්ෂණික දෝෂ ආදී විවිධ හේතූන් මත වෛද්‍ය සැපයුම් අංශය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඇණවුම් කර තිබුණු ඖෂධ වලින් විකුණුම් වටිනාකම රු.1,927,233,717 ක් වූ ඖෂධ ඒකක මිලියන 785 ක ප්‍රමාණයක් සැපයීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | පවතින බාධාකාරී තත්ත්වයන් අවම කර ගනිමින් වෛද්‍ය සැපයුම් අංශයේ ඇණවුම් සම්පූර්ණ කිරීමට උපරිම උත්සාහය ගනිමින් තම වෙළඳපල කොටස ආරක්ෂා කර ගත යුතුය. |
| (උ) | සංස්ථාව සිය උපරිම ධාරිතාවයෙන් කටයුතු කර නොතිබීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයා තිබුණු විකුණුම් වටිනාකම රු.5,300,782,520 ක් වූ ඖෂධ ඒකක මිලියන 2,076 අතරින් සංස්ථාවේ නිෂ්පාදනවලින් විකුණුම් වටිනාකම රු.2,140,206,445 ක් වූ ඖෂධ ඒකක මිලියන 1,338 ක් පමණක් සපයා තිබුණු අතර ඉතිරි විකුණුම් වටිනාකම රු.3,160,576,075 ක් වූ ඖෂධ ඒකක මිලියන 738 ක් බද්ධ ව්‍යාපාර සැපයුම් මඟින් ලබාදී තිබුණි. | බද්ධ ව්‍යාපාර හරහා නිෂ්පාදනය කරන බොහෝ නිෂ්පාදනයන් සාපේක්ෂව ප්‍රමාණයෙන් අඩු හා ඉහළ පිරිවැයක් සහිත අයිතම බව හා යෝජිත Lotus Pharma Project ඖෂධ නිෂ්පාදනාගාරය තුළ අප විසින් පිරිවැය අධික ආනයනික ඖෂධ නිෂ්පාදනය කිරීම කෙරෙහි මේ වන විට අවධානය යොමුකර ඇති බව. | සංස්ථාව සිය උපරිම නිෂ්පාදන කාර්යක්ෂමතාවයෙන් කටයුතු කරමින් වඩාත් වාසිදායක නිෂ්පාදන මිශ්‍රණය තෝරාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | සංස්ථාව විසින් නිෂ්පාදනය කරන ඖෂධ සඳහා, 2021 නොවැම්බර් 11 දින සිට 2021 නොවැම්බර් 31 දින දක්වා වූ සති 03 ක කාල සීමාව තුළදී පමණක්, නියැදියක් ලෙස තෝරාගත් බෙදාහරින්නන්ගෙන් ලද ඇණවුම් 50 කට අදාළ විකුණුම් ආදායම රු.85,707,417 ක් වූ ඖෂධ ඇසුරුම් ඒකක 136,964 ක් සැපයීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි. | ප්‍රමාණවත් නිෂ්පාදන ධාරිතාවයක් සංස්ථාව සතු නොවීම නිසා සමාලෝචිත වර්ෂය තුළදී බෙදාහරින්නන්ගේ සම්පූර්ණ ඉල්ලුම සපුරාලීමට නොහැකි වූ බව හා තව දුරටත් සංස්ථාවෙහි නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම හරහා අලෙවි අංශයට ඉහළ අලෙවි ඉලක්කයන් වෙත ළඟාවීමට හැකි බව. | ඉල්ලුමට සරිලන සැපයුමක් ලබා දීමට හැකිවන පරිදි සංස්ථාවේ නිෂ්පාදන ධාරිතාවය ඉහළ නංවාගත යුතු අතර පවත්නා තොග සම්බන්ධව නිරන්තර අධීක්ෂණයකින් කටයුතු කරමින් ඇණවුම් සම්පූර්ණ කළ යුතුය. |
| (එ) | සමාලෝචිත වර්ෂය තුළදී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් ඇණවුම් කර තිබුණු විකුණුම් වටිනාකම රු.444,538,751 ක් වූ ඖෂධ ඇසුරුම් ඒකක 988,283 ක් සැපයීමට සංස්ථාව අපොහොසත්වී තිබුණු අතර සැපයීමට හැකිවී තිබුණේ සියයකට 30 කටත් වඩා අඩු ප්‍රමාණයක් විය. | සංස්ථාවේ නිෂ්පාදන ධාරිතාවය ප්‍රමාණවත් නොවීම, SPC මඟින් ලබාදෙනු ලබන ඇනවුම් වරින් වර වෙනස් කිරීම නිසා ඇතැම් අවස්ථාවන්වලදී සංස්ථාවෙහි නිෂ්පාදනයන්වල ප්‍රමාණවත් තොග නොමැතිවීම හා හදිසි ඉල්ලුම් ප්‍රමාණයන් සැපයීමට නොහැකිවීම යන කරුණු රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ මාසික අලෙවි ඉලක්ක | ඉල්ලුමට සරිලන සැපයුම ලබාදීමට හැකිවන ලෙස නිෂ්පාදන ධාරිතාව ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කරා ළඟා නොවීමට ප්‍රධාන වශයෙන් බලපා ඇති බව. | |
| (ඒ) | අලෙවි අංශය තුළ දැනට ක්‍රියාත්මක විකුණුම් ක්‍රියාවලි පද්ධතිය (Sales Process) සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර එම අංශය වෙතින් නිකුත් කරන ඉන්වොයිස්වල ගේට්ටු අවසරපත්‍ර අංක සටහන් කර නොතිබුණි. තවත් සමහර ඉන්වොයිස් සඳහා අනුමැතිය ලබාදී නොතිබුණු අතර සමහර ඉන්වොයිස් පරීක්ෂා කළ බවට අත්සන් කර නොතිබුණු නමුත් ඒවා අනුමත කර තිබුණි. | අලෙවි අංශය තුළ දැනට විකුණුම් ක්‍රියාවලි පද්ධතියක් නොමැති බව, දැනට ප්‍රායෝගිකව භාවිතයේ යෙදවෙන විකුණුම් ක්‍රියාවලියේ දළ සැකැස්ම පමණක් විගණන අංශයේ ඉල්ලීම පරිදි ලබා දුන් බව, ඉන්වොයිස් 03 ක් අනුමත කිරීම මඟහැරී ඇති බව, නැවත එලෙස සිදු නොවීමට කටයුතු කරන බව හා 2022 වර්ෂය තුළදී මෙම සියලු අඩුපාඩු මඟහරවා ගනිමින් කටයුතු කරන බව. | විකුණුම් ක්‍රියාවලි පද්ධතියක් සකස් කර අනුමත කරවාගෙන ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඔ) | 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ කාල සීමාව තුළදී භාණ්ඩ නිෂ්කාශණ සමාගම් 24 ක තැන්පත් කර තිබුණු රු.853,500 ක් නිෂ්කාශණ කටයුතු අවසන් කර තිබියදී ආපසු අය කර ගැනීමට අපොහොසත්වී තිබුණි. | අදාළ පාර්ශවයන් දැනුවත් කර මෙම තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කරනබව. | නිශ්කාශණයන් නිමවූ වහාම තැන්පතු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඕ) | සමාලෝචිත වර්ෂය තුළදී වෛද්‍ය සැපයුම් අංශය වෙත සිදුකර තිබුණු විකුණුම්වලට අදාළව පරිගණක පද්ධතිය මඟින් නිර්මාණය වන විකුණුම් පිරිවැය උපලේඛනය තුළ විකුණුම් ඇණවුම් 04 ක නියැදියකට අදාළව ද්‍රව්‍ය පිරිවැය, සේවක පිරිවැය හා පොදු කාර්යය පිරිවැයවල එකතුව රු.38,182,618 ක් වුවද, විකුණුම් ඇණවුම් පිරිවැයට (Sales Order value) අනුව එය රු.52,400,228 ක් වූයෙන් වෙනස රු.14,217,610 ක් විය. වෙනසට හේතු අනාවරණය නොකෙරුණි. | විකුණුම් පිරිවැය සඳහා පරිගණක පද්ධතිය තුළ පවත්වා ගනු ලබන්නේ වෙනම Module එකක් බව, යම් අවස්ථාවලදී විකුණුම් ආපසු එවුම් ගිණුම්ගත කිරීමේදී ලෙජරයට නිවැරදිව සටහන් වුවද විකුණුම් පිරිවැය පද්ධතියේ නිවැරදිව සටහන් නොවන බව හා සමහර අවස්ථාවන්හිදී අදාළ පරිගණක සමාගම වෙත දැනුම් දීමෙන් අනතුරුව ඔවුන් විසින් අවශ්‍ය පියවර ගනු ලබන බව. | පාලන උපක්‍රමයන් වශයෙන් පවත්වාගෙන යනු ලබන එක් එක් අංශවලට අදාළ වාර්තා හා ලේඛන අතර ඇතිවන සංඛ්‍යාත්මක වෙනස්කම් පිළිබඳව නිරන්තර සොයා බැලීමක් කර සැසඳීම් කළ යුතුය. |

3.3 ප්‍රසම්පාදන කළමනාකරණය
---------------------------------

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම<br>-------------------------------------- | නිර්දේශය<br>------------ |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී රු.127,517,807 ක් වැයකර ඖෂධ අමුද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය ආදිය මිලදී ගැනීමේ අවස්ථා 04 කදී, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.3 මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රසම්පාදන | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.3 මාර්ගෝපදේශ ප්‍රකාරව පිළියෙල කළ ප්‍රසම්පාදන සැලැස්ම හා ප්‍රසම්පාදන කාල සටහන මේ සමඟ | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශවලට අනුව කටයුතු කළ |

| | | | |
|---|---|---|---|
| | සැලැස්මක් සහ ප්‍රසම්පාදන කාල සටහනක් අනුව කටයුතුකර නොතිබුණි. තවද 6.3.3 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු විවෘත කිරීමේ කමිටු පත් කර නොතිබුණු අතර 6.3.6 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘති පත්‍රයක වාර්තා කර නොතිබුණි. ප්‍රසම්පාදන කමිටු අනුමැතියට පෙර සැපයුම්කරු වෙත ඇණවුම් ලබාදී තිබුණු අතර පොදු කොන්ත්‍රාත් පනත යටතේ කොන්ත්‍රාත්තුව ලියාපදිංචි කිරීමේ සහතිකය සැපයුම්කරු වෙතින් ලබා ගෙන නොතිබුණි. 5.4.10 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව, කාර්ය සාධන සුරක්ෂණ ලබා ගෙනද නොතිබුණි. | නැවත ඉදිරිපත් කරන බව, 6.3.3 හා 6.3.6 මාර්ගෝපදේශ ප්‍රකාරව සිදුවී තිබුණු අඩුපාඩුව නිවැරදි කරගෙන ලංසු විවෘත කිරීම සඳහා කමිටුවක් පත් කර නියමිත පරිදි වාර්තා හා අත්සන් තබන බව, කාර්ය සාධන සුරක්ෂණය වෙනුවට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව මුළු ගෙවීමෙන් සියයට 10 ක් රඳවාගැනීමට කටයුතු කරන බව. | යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී පිරිවැය රු.11,068,650 ක් වූ පැරසිටමෝල් DC 90 අමු ද්‍රව්‍යයෙන් කිලෝ ග්‍රෑම් 6,000 ක් සැපයුම්කරුවන් තිදෙනෙකුගෙන් මිලදී ගෙන තිබුණි. ප්‍රසම්පාදන කමිටුව විසින් සැපයුම්කරුවන්ගේ ටෙන්ඩර් සාම්පල් සංස්ථාවේ රසායනාගාරය මගින් අනුමත කළ යුතු බව නිර්දේශ කර තිබුණු නමුත් ඒ සඳහා සාම්පල් පරීක්ෂා කර නොතිබුණි. තවද මෙම සැපයුම්කරුවන් තිදෙනාම අදාළ අමු ද්‍රව්‍යවල පෙර සැපයුම්කරුවන් නොවූ අතර ඔවුන් තිදෙනාම ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිවී නොතිබුණි. සංස්ථාවේ වට්ටෝරු සංවර්ධන හා නිෂ්පාදන දෙපාර්තමේන්තුව විසින් සිදු කර තිබුණු යන්ත්‍ර පෙරහුරු පරීක්ෂාවේදී සමත් විය යුතු Disintegration time, Less moisture content, Less flow ability, Friability and Compressibility යන අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් සැපයුම්කරුවන් දෙදෙනෙකු සපයා තිබුණු අමුද්‍රව්‍ය අසමත්වී තිබුණු අතර එක් සැපයුම්කරුවකුගේ යන්ත්‍ර පෙරහුරු පරීක්ෂණ වාර්තා විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. අමුද්‍රව්‍යවල සාම්පල් ටෙන්ඩර් ඇගයීමට ප්‍රථම පරීක්ෂා කර ගුණත්වය තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ වෙනුවට සැපයුම්කරු විසින් ඉදිරිපත් කර තිබුණු විශ්ලේෂණ වාර්තා මත පමණක් පදනම්ව සංස්ථාවේ තත්ත්ව පාලන අංශය විසින් ඖෂධ නිෂ්පාදනය සඳහා එම අමුද්‍රව්‍ය නිදහස් කර තිබුණි. | දැනට Paracetamol DC 90 අමුද්‍රව්‍ය සපයන නිෂ්පාදකයන් ජාතික ඒ නියාමන අධිකාරියේ ලියාපදිංචිය සඳහා අවශ්‍ය වැඩකටයුතු සිදුකරමින් පවතින බව, ඖෂධවල ගුණත්වය පිළිබඳව මෙහි දක්වා ඇති අර්ථ නිරූපණය නිවැරදි නොවන බව, ඖෂධයක ගුණත්වය යනු රෝගියෙකු අතට පත්වන අවස්ථාවේ ඖෂධයක තිබිය යුතු ප්‍රමිතිය වන බව, යන්ත්‍ර පරීක්ෂාවේදී මතුවන ගැටළු නිෂ්පාදන ක්‍රියාවලියේදී මතුවන අවහිරතාවයන් බව හා පැවතුන කොවිඩ් වසංගතය හමුවේ පැරසිටමෝල් ඖෂධයේ අධික අවශ්‍යතාවයද සැලකිල්ලට ගනිමින් අමුද්‍රව්‍යවල තත්ත්වය සියයට 100 කින් තහවුරු කරගැනීමෙන් අනතුරුව තත්ත්ව පාලන අංශය විසින් ඖෂධ නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය නිදහස් කළ බව. | ඖෂධ හා වෛද්‍ය උපකරණ සම්බන්ධයෙන් වූ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශවලට අනුව කටයුතු කළ යුතු අතර, ප්‍රසම්පාදන කමිටු නිර්දේශවලට මෙන්ම ඇණවුම් කොන්දේසි වලට අනුකූලවන ලෙස පසු ප්‍රසම්පාදන කටයුතුද සිදු කළ යුතුය. |
| (ඇ) | Levothyroxine sodium DC granules අමුද්‍රව්‍යයෙන් කිලෝග්‍රෑම් 50ක් (Manufacturing of pilot batches) රු.689,648 | මූලිකව මාස 06 ක ජීව කාලයක් ලබාදීම සිදු කළද එය අවුරුදු 02 ක් දක්වා ගුණාත්මකභාවය පරීක්ෂා | -එම- |

| | | | |
|---|---|---|---|
| | ක් වැයකර මිලදී ගෙන තිබුණු අතර අදාළ ඇණවුම් කොන්දේසිවලට අනුව අමුද්‍රව්‍ය දිවයිනට ලැබුණු දින සිට වර්ෂ 2 ½ ක ජීව කාලයක් පැවතිය යුතු වුවද, ලැබී තිබුණු අමුද්‍රව්‍යවල ජීව කාලය ඒවා ලැබුනු දින සිට මාස 05 ක් පමණක් විය. මේ පිළිබඳ සැපයුම්කරු විමසීමක් හෝ අමුද්‍රව්‍ය නැවත ලබා ගැනීමකින් තොරව සැපයුම්කරුගෙන් ලබාගෙන තිබුණු ප්‍රකාශයක් (Declaration Letter) පදනම් කරගෙන මෙම අමුද්‍රව්‍යය භාවිතාකර නිෂ්පාදනය කර තිබුණු Levothyroxine Tablets 1P 50 mcg ඖෂධයේ ජීව කාලය වර්ෂ 02 ක් වන බවට සටහන් කර තිබුණි. | කරමින් නිෂ්පාදනය සිදු කළ හැකි බව, එය ඖෂධ නිෂ්පාදකයා විසින් තීරණය කරන බව, ඖෂධයන් නිෂ්පාදනය කරනු ලබන්නේ තත්ත්ව පාලන අංශයේ පූර්ණ අධීක්ෂණය හා අනුමැතිය යටතේ බව, අවුරුදු දෙකක් සඳහා තත්ත්ව තහවුරු සහතිකයක් (Quality Assurance Certificate) නිෂ්පාදකයා විසින් ලබාදී ඇති බව, අදාළ අමුද්‍රව්‍යයේ ජීවකාලය ලංකාවට ලැබුණු දින සිට මාස 05 ක් බව සත්‍යයක් වුවද මෙම අමුද්‍රව්‍ය යොදාගෙන වසර දෙකක ජීව කාලයක් සහිත පෙති නිෂ්පාදනය කළ හැකි බව හා අවුරුදු දෙකක කාලය නිර්ණය කර ඇත්තේ ස්ථායිතා පරීක්ෂණ (Accelerated Stability Studies) සිදු කිරීමෙන් පසුව බව. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබුණු Flucloxacillin Sodium BP 2000 අමුද්‍රව්‍යයෙන් පිරිවැය රු.23,331,831 ක් වූ කිලෝග්‍රෑම් 3,000 ක් අවශ්‍ය ප්‍රමිතියෙන් තොර බැවින් සංස්ථාවේ තත්ත්ව පාලන දෙපාර්තමේන්තුව විසින් 2021 ජුනි 25 දින ප්‍රතික්ෂේප කර තිබුණු නමුත් 2022 මැයි 27 දින වන විටත් මෙම අමුද්‍රව්‍ය තොගය ප්‍රතිස්ථාපනය කර ගැනීමට හෝ සැපයුම්කරුගෙන් මුදල් අයකර ගැනීමට හෝ සැපයුම්කරුට එරෙහිව වෙන යම් ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණි. තවද මෙම ප්‍රසම්පාදනයට අදාළ රු.6,999,549 ක කාර්යසාධන බැඳුම්කරය 2021 සැප්තැම්බර් 30 දින කල් ඉකුත්වී තිබුණු අතර ඊට පෙර එය මුදල් කර ගැනීමට හෝ එය යාවත්කාලීන කර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | ප්‍රතික්ෂේපිත අමුද්‍රව්‍ය තොගයට අදාළ වටිනාකම සංස්ථාව වෙත ගෙවීමට සැපයුම්කරු මූලික වශයෙන් එකඟ වී ඇති බව, ඒ සඳහා අවශ්‍ය කටයුතු කරගෙන යමින් පවතින බව, කාර්යසාධන බැදුම්කරය යාවත්කාලීන කර නොමැති බව හා හැකි විගස තොගය ප්‍රතිස්ථාපනය කර ගැනීමට හෝ අදාළ පිරිවැය පියවා ගැනීමට කටයුතු කරන බව. | ඖෂධ හා වෛද්‍ය උපකරණ සම්බන්ධයෙන් වූ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශවලට අනුව කටයුතු කළ යුතු අතර ප්‍රසම්පාදන කමිටු නිර්දේශවලට මෙන්ම ඇණවුම් කොන්දේසි වලට අනුකූල වන ලෙස පසු ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුය. |

3.4 බද්ධ ව්‍යාපාර කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දේශීයව ඖෂධ නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය පුළුල් කිරීම සඳහා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව හා යෝග්‍ය පෞද්ගලික ආයෝජකයන් අතර බද්ධ ව්‍යාපාර ආරම්භ | ආයෝජකයින් 17 දෙනෙකු සමඟ බද්ධ ව්‍යාපාර සඳහා ගිවිසුම් ගත වුවද, ඉන් ආයෝජකයින් දෙදෙනෙක් විසින් කර්මාන්තශාලා ඉදිකර නොමැති බව | ගිවිසුම් ගතවී ඇති අනෙකුත් ආයෝජකයන් දිරිමත් කරමින් |

| | | | |
|---|---|---|---|
| | කිරීම සඳහාවූ යෝජනාව යටතේ සංස්ථාව විසින් විහව ආයෝජකයින් 17 දෙනෙකු සමඟ ඖෂධ සැපයීම සඳහා ගිවිසුම් ගතවී තිබුණු නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ආයෝජකයින් 04 දෙනෙකුගෙන් පමණක් ඖෂධ මිලදී ගෙන තිබුණි. | හා ඉතිරි ආයෝජකයින් 15 දෙනා අතරින් ආයෝජකයින් 4 දෙනෙකු විසින් පමණක් වෛද්‍ය සැපයුම් අංශයට ඖෂධ සැපයීමට අවශ්‍ය නිෂ්පාදනාගාර පහසුකම් සහ සුදුසුකම් සපුරා ඇති බව. | බද්ධ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ආ) | බද්ධ ව්‍යාපාරවලින් සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයා තිබුණු ඖෂධ හා ශල්‍ය පරිභෝජන ද්‍රව්‍ය අයිතම 56 කින් අයිතම 21 ක් සඳහා පමණක් සංස්ථාව විසින් තත්ත්ව පරීක්ෂාවන් සිදුකර තිබුණි. ඒ අනුව අයිතම 35 ක තත්ත්වය පරීක්ෂා කිරීමට සංස්ථාව කටයුතු නොකර වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයා තිබුණි. ඒ අතරින් ශල්‍ය පරිභෝජන ද්‍රව්‍ය අයිතම 03 ක් එක් ආයෝජකයෙකුගෙන් මිලදී ගෙන වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයා තිබුණද එම ද්‍රව්‍යයන්හි තත්ත්වය පරීක්ෂා කිරීමට අවශ්‍ය පහසුකම් සංස්ථාව සතු නොවීම හේතුවෙන් සැපයුම්කරු සෘජුවම කාර්මික තාක්ෂණික ආයතනය (ITI) වෙත සාම්පල් යවා ලබා ගෙන තිබුණු තත්ත්ව පරීක්ෂණ වාර්තා මත පමණක් පදනම්ව මිලදී ගෙන තිබුණි. ඒ අනුව බද්ධ ව්‍යාපාර යටතේ වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයනු ලබන ඖෂධවල ගුණත්වය පිළිබඳ ප්‍රමාණවත් ස්වාධීන තහවුරුවක් සිදුවී නොතිබුණු බව නිරීක්ෂණය විය. | එම ද්‍රව්‍ය අයිතම වෙනුවෙන් තත්ත්ව පරීක්ෂණ කටයුතු සිදු කිරීමට අවශ්‍ය කරනු ලබන රසායනික ද්‍රව්‍ය හා විශ්ලේෂණ කටයුතු සිදු කරනු ලබන විද්‍යාත්මක උපකරණ සඳහා අවශ්‍ය කරනු ලබන පරිභෝජනීය අමතර කොටස් (consumables spare parts) ලබා ගැනීම සඳහා 2021 වර්ෂය පුරාවටම පැවති covid 19 වසංගත තත්ත්වය හමුවේ නොහැකි වූ බව, ශල්‍ය පරිභෝජන අයිතම වෙනුවෙන් ITI ආයතනය වෙත ගොස් අධ්‍යනයක යෙදුණු බව හා ඒ සඳහා අවශ්‍ය කරන උපකරණ මිලදී ගැනීමෙන් අනතුරුව 2022 වර්ෂයේ සිට රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ රසායනාගාරය තුළදී ඉහත සඳහන් තත්ත්ව පරීක්ෂාවන් සිදු කිරීමට කටයුතු කරන බව. | බද්ධ ව්‍යාපාර යටතේ වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයනු ලබන ඖෂධවල ගුණත්වය පිළිබඳ ප්‍රමාණවත් ස්වාධීන තහවුරුවක් සංස්ථාව විසින් සිදුකළ යුතුය. |
| (ඇ) | බද්ධ ව්‍යාපාර සඳහා ගිවිසගත් ආයෝජකයා විසින් නිෂ්පාදනය කරන ඖෂධ හා ශල්‍ය පරිභෝජන ද්‍රව්‍යවල නිෂ්පාදිත පිරිවැයට සියයට 20 ක ලාභ ආන්තිකයක් එකතු කර විකුණුම් මිල තීරණය කළ යුතු විය. සමාලෝචිත වර්ෂය තුළදී එක් ආයෝජකයෙකුගෙන් සපයාගෙන වෛද්‍ය සැපයුම් අංශයට අලෙවිකර තිබුණු ඖෂධ අයිතම 01 ක මුළු නිෂ්පාදන පිරිවැය රු.6,262,252 ක් වී තිබුණි. ආයෝජකයා විසින් එම අයිතමය රු.6,112,800 කට සංස්ථාව වෙත සපයා තිබුණි. සංස්ථාව විසින් එම ඉන්වොයිස් වටිනාකමට තවත් රු.2,235,696 ක සේවා ගාස්තු එකතු කර රු.8,348,496 කට වෛද්‍ය සැපයුම් අංශයට අලෙවි කර තිබුණි. එම ඖෂධ අයිතමයෙහි නිෂ්පාදන පිරිවැයෙන් සියයට 33 ක ලාභ ආන්තිකයක් ආයෝජකයා විසින්ද ගත් | සංස්ථාව හා බද්ධ ව්‍යාපාර විසින් වෛද්‍ය සැපයුම් අංශය වෙත සපයනු ලබන ඖෂධ මිල තීරණය කිරීම සඳහා පවත්වනු ලබන මිල කමිටු රැස්වීම් මාස 06 කට වරක් පවත්වන බව, මෙම ඖෂධයේ මිල 2021 අප්‍රේල් 05 දින පැවති මිල කමිටු රැස්වීමේදී තීරණය කළ බව, ඇසුරුම් ඒකකයක මිල රු.173,927 ක් වුවද, මෙම ඖෂධයේ අමුද්‍රව්‍ය මිල පහත යාම මත බද්ධ ව්‍යාපාරය විසින් ඇසුරුම් ඒකකයක මිල රු.127,350 ක් දක්වා අඩු කළ බව හා අඩු කළ මිල සඳහා නැවත මිල කමිටු අනුමැතිය ලබා ගැනීමට කාලයක් නොමැති වූ බව. | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ මිල කමිටුව විසින් නිර්දේශ කර තිබුණු පරිදි ඖෂධ හා ශල්‍ය පරිභෝජන ද්‍රව්‍යවල නිෂ්පාදිත පිරිවැයට සියයට 20 ක ලාභ ආන්තිකයක් එකතු කර විකුණුම් මිල තීරණය කළ යුතු යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මිලෙන් සියයට 37 ක ලාභ හා සේවා ගාස්තු සංස්ථාව විසින්ද අයකර තිබුණි. | | |
| (ඇ) | බද්ධ ව්‍යාපාර සැපයුම් සඳහා ගැණුම් මිලෙන් සියයට 6 ලාභ ප්‍රතිශතයක් එකතු කර වෛද්‍ය සැපයුම් අංශයට ඖෂධ සපයන බවට වූ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය තුළදී බද්ධ ව්‍යාපාරවලින් මිලදී ගෙන වෛද්‍ය සැපයීම් අංශයට සැපයූ ඖෂධවලින් සංස්ථාව විසින් ගැණුම් මිලෙන් සියයට 17 සිට සියයට 37 දක්වා ලාභ ප්‍රතිශතයක් උපයා තිබුණි. | 2021 ඔක්තෝම්බර් 05 දින පවත්වන ලද මිල කමිටු රැස්වීමේදී අදාළ ඖෂධවල මිල ගණන් වෙනස් වීමට අදාළව ඔවුන් විසින් ලබා දුන් පිරිවැය පත්‍රිකාවලට අනුව ඔවුන්ගේ ඉන්වොයිසි වෙනස්කර නොතිබුණු බව. | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිල කමිටුව විසින් නිර්දේශ කර තිබුණු පරිදි මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණු ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව අදාළ ගනුදෙනු සිදුකළ යුතුය. |
| (ඉ) | බද්ධ ව්‍යාපාර යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කර තිබුණු නිල කමිටුව (Official committee) විසින් නිර්දේශ කර තිබුණු පරිදි, ආයෝජකයාගේ නිෂ්පාදන ක්‍රියාවලියේ තත්ත්ව පාලනය, කළමනාකරණය හා තාක්ෂණික සහාය සංස්ථාව විසින් සැපයිය යුතු අතර, ඒ සඳහා එම ආයෝජකයාගේ ව්‍යාපාරයේ කොටස්වලින් සියයට 10 ක් සංස්ථාව වෙත නිකුත් කළ යුතු විය. කෙසේ නමුත් සංස්ථාව විසින් දැනට ගනුදෙනු කරනු ලබන ආයෝජකයන් දෙදෙනෙකු විසින් පමණක් සංස්ථාව වෙත කොටස් නිකුත්කර තිබුණු අතර ඉතිරි ආයෝජකයන් දෙදෙනා විසින් 2022 මැයි 30 දින වන විටත් සංස්ථාව වෙත සිය කොටස් නිකුත්කර නොතිබුණි. | එම ආයෝජන සමාගම් සඳහා අධ්‍යක්ෂකවරුන් පත් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව හා එම ආයතනද කොටස් සහතික නිකුත් කිරීමට අදාළ ලිපි ලේඛන සකස් කරමින් පවතින බව. | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිල කමිටුව විසින් නිර්දේශ කර තිබුණු පරිදි කටයුතු කළ යුතුය. |

3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු
-------------------------------------

| | විගණන නිරීක්ෂණය<br>------------------------ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම<br>------------------------------------- | නිර්දේශය<br>------------ |
|---|---|---|---|
| (අ) | ගොඩනැගිලි දෙකක් යා කෙරෙන යෝජිත ගුවන් පාලම ඉදිකිරීම සඳහා 2022 මැයි 27 දින වන විට රු.6,016,902 ක් වැය කර තිබුණු නමුත් කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම් ගතවී ඉදිකිරීම් ආරම්භ කර වසර 03 කට පසු ඉදිකිරීම් ශක්‍ය නොවන බව තීරණය කර ඉදිකිරීම් කටයුතු නවතා දැමීමට පාලන අධිකාරිය තීරණය කර තිබුණු බැවින් | නිෂ්පාදන පුළුල් කිරීමේ ව්‍යාපෘතියක් ලෙස කලාප දෙකක් අතර භාණ්ඩ හුවමාරු කිරීම කාර්යක්ෂමව සහ ප්‍රමිතියකින් යුතුව ඉටුකිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කළ නමුත් පසුව සලකා බැලීමේදී මෙම කලාප දෙක අතර භාණ්ඩ හුවමාරුව අනවශ්‍ය වූ බැවින් මෙම පාලම ඉදිකිරීම ප්‍රයෝජනවත් නොවූ | නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට දායක වූ වගකිවයුතු පාර්ශවයන්ගෙන් වැයවූ මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වැයකර තිබුණු මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | බව හා ප්‍රායෝගිකව සලකා බලා ගත් තීරණයක් මත මෙම ඉදිකිරීම නතර කිරීමට සිදුවූ බැවින් එය නිශ්කාර්‍ය වියදමක් සේ සැලකීම නිවැරදි නොවන බව. | |
| (ආ) | සිවි මහල් පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.27,550,136 ක් වැය කර ආරම්භක භූගත filling වැඩකටයුතු සිදු කර තිබුණු අතර 2018 මාර්තු 07 දින එම filling වැඩ අවසන් කර තිබුණු නමුත් 2022 මාර්තු 31 දින වන විට වර්ෂ 04 කට ආසන්න කාලයක් ගතවී තිබුණද මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සුදුසුකම්ලත් කොන්ත්‍රාත් ආයතනයක් තෝරා ගැනීමට හා ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි. | අඩුම ලංසුව ඉදිරිපත් කළ ප්‍රතිචාරත්මක ලංසුකරුගේ මිල ගණන් ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා අඩු වීමත්, මෙම ලංසුකරු විසින් 2019 වර්ෂයේදී ඉදිකර තිබුණු සිවුමහල් ගොඩනැගිල්ලේ අඩුපාඩු පැවතීම හා සම්මතයන්ට අනුකූලව ඉදිකර නොතිබීම හේතුවෙන් මෙම කොන්ත්‍රාත්තුව අවලංගු කර ඇති බව හා වර්තමාන අවශ්‍යතාවයන්ට අනුකූලව සැලසුම සමාලෝචනය කිරීමටත්, ඉදිරි අදියරයන් ක්‍රියාත්මක කිරීමටත්, නව උපදේශන සමාගමක සේවය ලබා ගැනීමටත් සිදුවන බව. | කොන්ත්‍රාත් පරිපාලන කටයුතු රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව විධිමත්ව සිදුකළ යුතු අතර එම කාර්යයන් මනාව කළමණාකරනය කිරීමට හා අධීක්ෂණය කිරීමටද කටයුතු කළ යුතුය. වැයකර ඇති මුදල් අපතේ නොයවා ඉදිරි කටයුතු සැලැසුම් කළ යුතුය. |
| (ඇ) | නිමි ඖෂධ තොග ගබඩා කිරීමට දෙමහල් ගබඩා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2018 සැප්තැම්බර් 21 දින ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණු අතර 2022 මාර්තු 31 දින වන විට මෙම ඉදිකිරීම සඳහා රු.36,943,060 ක් වැය කර තිබුණි. මූලික ගිවිසුම ප්‍රකාරව 2019 අගෝස්තු 21 දින වන විට ඉදිකිරීම් නිම කළ යුතු වූ නමුත් ඉදිකිරීම් දිගින් දිගටම ප්‍රමාදවී තිබුණු අතර ඉදිකිරීම් සමාගම විසින් පසුව ලබාදී තිබුණු ව්‍යාපෘති කාර්ය සාධන වැඩ සටහනට අනුව 2022 මැයි 17 දින වැඩ අවසන් කිරීමට යෝජිතව තිබුණු නමුත් මේ සඳහා දින දීර්ඝ කිරීම් සිදු කර නොතිබුණි. | 2019 වසර වන විට සංස්ථාවට රජයෙන් අයවීමට තිබුණු මුදල් ප්‍රමාදවීම හේතුවෙන් ගෙවීම් සිදු කළ නොහැකිවීම හා කොවිඩ් වසංගත තත්ත්වය නිසා ඉදිකිරීම් කටයුතු දිගින් දිගටම ප්‍රමාද වූ බව, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් මෙම ගොඩනැගිල්ලේ ව්‍යුහය නැවත විශ්ලේෂණය කළ බව, එම නිර්දේශ ක්‍රියාත්මක කරමින් ටෙන්ඩරය ප්‍රදානය කළ පිරිවැය තුළම ඉදිකිරීම් සමාගම විසින් ව්‍යාපෘතිය කරගෙන යාමට එකඟ වූ බව, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සිදුවූ විශාල මිල ගණන් වැඩිවීම හේතුවෙන් සැලසුම් සංශෝධනය කරමින් සිදුකර ඇති එකඟතා නිසා විශාල මූල්‍යමය ගැටළුවකට මුහුන දීමට සිදුවී ඇති බව හා 2022 අප්‍රේල් 20 දින වන විට වැඩ අවසන් කිරීමට ඉදිකිරීම් සමාගම එකඟවූ බව. | -එම- |

3.6 මානව සම්පත් කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ අනුමත සේවක සංඛ්‍යාව 423 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 326 ක්ද පුරප්පාඩු සේවක සංඛ්‍යාව 97 ක්ද විය. නමුත් 2022 මාර්තු 31 දින වන විටත් නිෂ්පාදන ක්‍රියාවලියට ඉතාමත් වැදගත් අංශ වූ වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන අංශය මෙන්ම තත්ත්ව පාලන අංශය සඳහා වූ අංශ ප්‍රධාන තනතුරු 02 ක් ඇතුළුව විධායක ශ්‍රේණියේ තනතුරු 17 ක්, විධායක නොවන ශ්‍රේණියේ තනතුරු 48 ක් සහ සුළු සේවක තනතුරු 30 ක් වශයෙන් පුරප්පාඩු තනතුරු 95 ක්ම සම්පූර්ණ කර ගැනීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | අංශ ප්‍රධාන තනතුරු 02 සඳහා 2020 සැප්තැම්බර් 20 දින අයදුම්පත් කැඳවූ බව, සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබූ අයදුම්කරු 2021 දෙසැම්බර් 01 දින පැවති සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් නොවූ බව, එම තනතුරු 02 ක සඳහා 2021 දෙසැම්බර් 12 දින පුවත්පත් මගින් නැවත අයදුම්පත් කැඳවූ බව හා ඉදිරියේදී සම්මුඛ පරීක්ෂණ පවත්වා බඳවා ගැනීමට කටයුතු කරන බව. | බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව හා විධිමත්ව අවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) අනුමත තනතුරු 07 ක් සඳහා බඳවා ගැනීමේ පටිපාටින් පිළියෙල කර කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගැනීමට 2022 මැයි 27 දින වන විටත් අපොහොසත්වී තිබුණි. | තනතුරු 04 කට අදාළ බඳවා ගැනීමේ පටිපාටින් අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බව හා ඉතිරි තනතුරු 03 ට අදාළ බඳවා ගැනීමේ පටිපාටින් සකස් කර පරීක්ෂා කිරීම් සිදු කරමින් පවතින බව. | බඳවා ගැනීමේ පටිපාටින් පිළියෙල කර කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එහි ඇතුළත් කර තිබුණු නිෂ්පාදන, මානව සම්පත්, අලෙවි, අභ්‍යන්තර විගණන සහ වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුවලට අදාළ ක්‍රියාකාරකම් සඳහා කිසිදු මූල්‍යමය වටිනාකමක් දක්වා නොතිබුණි. | සියලු ක්‍රියාකාරකම් සඳහා මූල්‍යමය වටිනාකම් ඇතුළත් කර 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කිරීමට හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | ක්‍රියාකාරී සැලැස්ම විධිමත් ලෙස පිළියෙල කර අවශ්‍ය අනුමැතීන් ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, කාලච්ඡේදයන් තුළ ඉටුකරගත යුතු ක්‍රියාකාරකම්වල කාර්යසාධනය ඇගයීමට හැකිවන පරිදි කාර්යසාධන නිර්ණායක (Key Performance Indicators) ඇතුළත් කර ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වුවද, පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ක්‍රියාකාරකම්වල කාර්යසාධන නිර්ණායක නිශ්චිතව, ප්‍රමාණාත්මකව මෙන්ම මැනිය හැකි මට්ටමින් දක්වා නොතිබීම හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් ඉටුකර ගැනීමේ ප්‍රගතිය නිශ්චිතව ඇගයීමට නොහැකි විය. | 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පීඊඩී 12 චක්‍රලේඛයට අනුව පිළියල කළ බව හා 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම්වල කාර්ය සාධන නිර්නායක නිශ්චිතව, ප්‍රමාණාත්මකව ඇතුළත් කරන බව. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ක්‍රියාකාරී සැලස්මේ ඇතුළත් ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 515.5 ක් වූ ක්‍රියාකාරකම් 27 ක් අතරින් ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 19 ක් වූ ක්‍රියාකාරකම් 06 ක් හා පිරිවැය ඇස්තමේන්තු කර නොතිබුණු ක්‍රියාකාරකම් 27 ක් සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කර හෝ නොතිබුණු අතර ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 473 ක් වූ ක්‍රියාකාරකම් 10 ක් සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කර තිබුණද අවසන් කර නොතිබුණි. එසේම කිසිදු ක්‍රියාකාරකමක සමාලෝචිත වර්ෂය තුළදී ලබා කරගත් භෞතික ප්‍රගතිය හෙළිදරව් කර නොතිබුණි. | සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් එවන ලද ආකෘතියට අනුව ක්‍රියාකාරී සැලස්ම පිළියෙල කිරීමේදී මූල්‍ය ප්‍රගතිය මැනිය හැක්කේ අදාළ ආකෘතියේ දක්වා ඇති භෞතික ප්‍රගතිය ප්‍රතිශතාත්මකව යනුවෙන් දක්වා ඇති තීරුවට අනුව බව හා ඒ අනුව භෞතික ප්‍රගතියේ ප්‍රතිශතාත්මක අගය මඟින් කොපමණ මූල්‍ය ප්‍රගතියක් ඇතිදැයි මැන බැලිය හැකි බව. | -එම- |